ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
Business & Accounting Studies

| 60 | S | I,II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2011 ජූලි - 10 ශ්‍රේණිය
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2011 - Grade 10

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I , II**
**வணிகக் கல்வியும் கணக்கீடும் I , II**
**Business and Accounting Studies I , II**

පැය තුනයි
*Three hours*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුය :

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) **1** සිට **40** තෙක් ප්‍රශ්න වල දී ඇති **(1), (2), (3), (4)** පිළිතුරු වලින් **නිවරැදි හෝ වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරට අදාල අංකය හා සැසඳෙන කවය මත (x) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

(v) I හා II පිළිතුරු පත්‍ර එක් පත්‍රයක් වන සේ එකට අමුණා භාර දෙන්න.

---

01. වෙළඳාමේ මූලාරම්භය වනුයේ,
    1. මිල ක්‍රමය  2. භාණ්ඩ හුවමාරුව  3. මුදල් භාවිතය  4. වක්‍ර නිෂ්පාදනය

02. භාණ්ඩවල මිල වැඩි වීම නිසා ඇතිවන අනිවාර්ය ප්‍රතිවිපාකය වන්නේ,
    1. ජීවන වියදම් වැඩිවීම  2. ජීවන තත්වය පහත වැටීම
    3. උද්ධමනය වැඩිවීම  4. මුදලේ අගය අඩු වීම.

03. අවශ්‍යතා හා වුවමනා ඉටුකරන ඕනෑම දෙයක් හඳුන්වන්නේ,
    1. ආර්ථික භාණ්ඩ  2. ස්වභාවික භාණ්ඩ  3. භාණ්ඩ හා සේවා  4. නිෂ්පාදනය

04. මැණික් ගැරීම හා මසුන් ඇල්ලීම යන කර්මාන්ත දෙවර්ගය වනුයේ,
    1. කෘෂි හා ඛනක  2. ඛනක හා වනජ  3. ඛනක හා ධීවර  4. ධීවර හා වනජ

05. පහත සඳහන් දෑ අතරින් අවශ්‍යතාවක් නොවන්නේ,
    1. ආහාර  2. මහල් නිවාස  3. අධ්‍යාපනය  4. සෞඛ්‍යය

06. අවශ්‍යතාවක් හා වුවමනාවක් අනුපිළිවෙලින් දැක්වෙන ප්‍රකාශය තෝරන්න.
    1. සෞඛ්‍යය හා ආරක්ෂාව  2. වෛද්‍යවරු හා රෝහල්
    3. ආහාර හා නිවාස  4. අධ්‍යාපනය හා පොත්පත්

07. ව්‍යාපාරයක් යන්නෙන් අදහස් කරන්නේ,
    1. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන ආයතනයකි.
    2. ලාභ ලැබීමේ අරමුණින් සිදු කරනු ලබන ඕනෑම කටයුත්තකි.
    3. මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකරනු ලබන ඕනෑම කටයුත්තකි.
    4. යෙදවුමක් නිමවුමක් බවට පත් කරන ආයතනයකි.

08. භාණ්ඩ හුවමාරු ක්‍රමයේ පැවති දුර්වලතාවක් නොවන්නේ,
    1. ද්විත්ව සමපාතය නොගැලපීම.  2. මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගත හැකි වීම.
    3. වටිනාකම මැනීමේ අපහසුතා  4. භාණ්ඩ කුඩා කොටස්වලට වෙන් කළ නොහැකිවීම.

09. ප්‍රාථමික නිෂ්පාදනය වර්ගීකරණය කළ හැක්කේ,
    1. ගැලපුම් හා පෙරළුම් ලෙස ය.  2. පතල් හා කැණීම්, ධීවර හා නිමවුම් ලෙස ය.
    3. ඉදිකිරීම්, නිමවුම්, කෘෂි හා වන ලෙසය.  4. කෘෂි, වන, ධීවර, පතල් හා කැණීම් ලෙස ය.

දෙවන පිටුව බලන්න

10. භාණ්ඩ බෙදාහැරීම ක්‍රම කිහිපයකින් සිදුවේ. ඊට අදාල නොවන ක්‍රමය වනුයේ,
1. නිෂ්පාදකයා - පාරිභෝගිකයා
2. නිෂ්පාදකයා - සිල්ලර වෙළෙන්දා - පාරිභෝගිකයා
3. නිෂ්පාදකයා - තොග වෙළෙන්දා - සිල්ලර වෙළෙන්දා - පාරිභෝගිකයා
4. නිෂ්පාදකයා - සිල්ලර වෙළෙන්දා - තොග වෙළෙන්දා - පාරිභෝගිකයා

11. බාහිර පරිසර සාධකයක් නොවන්නේ,
1. ආර්ථික පරිසරය 2. ප්‍රජා පරිසරය 3. ගනුදෙනුකරුවන් 4. තාක්‍ෂණික පරිසරය.

12. බාහිර පරිසරය අධ්‍යයනය තුළින් හදුනාගත හැකි අවස්ථාවක් වන්නේ,
1. දේශපාලන අස්ථාවරත්වය 2. ස්වභාවික ආපදා
3. අහිතකර ආර්ථික ප්‍රතිපත්ති 4. ව්‍යාපාර වලට හිතකර නිතිරීති

13. ඒකල ස්වාමි ව්‍යාපාරයක අවාසියක් වන්නේ,
1. ලාභ තනිව භුක්ති විඳිය හැකි වීම. 2. නෛතික පුද්ගලභාවයක් නොතිබීම්.
3. පහසුවෙන් ආරම්භ කල හැකිවීම. 4. ඉක්මනින් තිරණ ගත හැකිවීම.

14. හවුල් ව්‍යාපාරයක් කෙරෙහි බල නොපාන පණත වනුයේ,
1. 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පණත 2. 2007 අංක 7 දරණ සමාගම් පණත
3. 1972 අංක 05 දරණ සමුපකාර පණත 4. 1840 වංචා වැළැක්වීමේ ආඥා පණත

15. හවුල් ව්‍යපාරයකට ප්‍රාග්ධනය යොදා එහෙත් කළමණාකරණ කටයුතු වලට සහභාගි නොවන හවුල්කරු හදුන්වනු ලබන්නේ,
1. සීමිත හවුලකරු ලෙස ය. 2. අක්‍රිය හවුල්කරු ලෙස ය.
3. ආරූඩ හවුල්කරු ලෙස ය. 4. නාමික හවුල්කරු ලෙස ය.

16. නීතිමය පුද්ගලභාවයක් නොමැති ව්‍යාපාර සංවිධානය වන්නේ,
1. සීමාසහිත පුද්ගලික සමාගම් 2. රාජ්‍ය ව්‍යවසාය
3. තනි අයිතිය 4. සීමිත පොදු සමාගම

17. 2007 අංක 07 දරණ සමාගම් පණත යටතේ සමාගමක් ලියාපදිංචි කිරීමට ඉදිරිපත් කළ යුතු ලියවිලි අතරට ඇතුළත් වන්නේ,
1. රක්‍ෂණ ඔප්පුවක් 2. සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය
2. සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය 4. සාංගමික ව්‍යස්ථාවලිය හා සංස්ථාපත්‍රය යන දෙකම

18. ලාභ අරමුණුකර ගත් රාජ්‍ය අංශයේ ව්‍යාපාර වන්නේ,
1. රාජ්‍ය සමාගම් 2. දෙපාර්තමේන්තු 3. සමුපකාර 4. රාජ්‍ය සංස්ථා

19. සමුපකාර ව්‍යාපාරයක ලක්‍ෂණයක් නොවන්නේ,
1. සාමාජිකයාගේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු නොකිරීම
2. මූලිකව ලාභ පරමාර්ථයෙන් කටයුතු නොකිරීම.
3. අතිරික්තය සාමාජිකයා අතර බෙදීම.
4. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් තිබීම.

20. ව්‍යාපාර සැලැස්මක අන්තර්ගත නොවන්නේ,
1. මානව සැලැස්ම 2. අළෙවි සැලැස්ම 3. මෙහෙයුම් සැළැස්ම 4. මූල්‍ය සැලැස්ම

21. අළෙවි සැලැස්මක අන්තර්ගත නොවන කරුණක් වන්නේ,
1. අපේක්‍ෂිත විකුණුම් ආදායම 2. අපේක්‍ෂිත ලාභය
3. අපේක්‍ෂිත වියදම 4. අපේක්‍ෂිත ඉල්ලුම

තුන්වන පිටුව බලන්න

22. යම් කාලච්ඡේදයක් අවසාන දිනට මූල්‍ය තත්වය පෙන්නුම් කිරීම සඳහා පිළියල කරනුයේ,
   1. ශේෂ පත්‍රය 2. ආදායම් ප්‍රකාශය 3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය 4. මුදල් පොත.

23. ව්‍යාපාරිකයාගේ සමාජ වගකීමකි.
   1. පරිසරය සුරකීම 2. නිවැරදි කිරුම් - මිනුම් උපකරණ භාවිතය
   3. සේවකයන්ට සාධාරණ වැටුප් ගෙවීම 4. ආයෝජනයට ප්‍රමාණවත් ඉපයීමක් ලබා දීම.

24. ව්‍යාපාරයක කාරක ප්‍රාග්ධනය යනු,
   1. අයිතිකරු විසින් ව්‍යාපාරය ආරම්භ කිරීමට යොදන මුදල් ය.
   2. අයිතිකරුවන් වෙනුවෙන් බාහිර පාර්ශවයන් යොදන මුදල් ය.
   3. එදිනෙදා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට උපකාරී වන මුදල් ය.
   4. මේ කිසිවක් නොවේ.

25. වාණිජ බැංකුවක අනිවර්යෙන්ම තිබිය යුතු ගිණුමකි,
   1. ජංගම ගිණුම 2. ඉතිරිකිරීමේ ගිණුම
   3. කාලීන තැන්පත් ගිණුම 4. ස්ථාවර තැන්පත් ගිණුම

26. කොටසින් සීමිත සමාගමක් නොවනුයේ,
   1. සී/ස අක්වෙරල සමාගම් 2. සී/ස පෞද්ගලික සමාගගම්
   3. සී/ස පොදු සමාගම් 4. ඉහත කිසිවක් නොවේ.

27. ඒකීය බැංකු ක්‍රමයට නිදසුනක් වන්නේ,
   1. කොළඹ ජීවත්වන මහජන බැංකුවේ ගනුදෙනුකරුවන්ට අනුරාධපුර මහජන බැංකුවෙන් මුදල් ලබා ගත හැකි වීම.
   2. කොළඹ ජීවත්වන මහජන බැංකුවේ ගනුදෙනුකරුවන්ට අනුරාධපුර ලංකා බැංකුවෙන් මුදල් ලබා ගත හැකි වීම.
   3. කොළඹ ජීවත්වන මහජන බැංකුවේ ගනුදෙනුකරුවන්ට ලංකාවේ ඕනෑම බැංකු ශාඛාවකින් මුදල් ලබා ගත හැකි වීම.
   4. ලංකා බැංකුව හා මහජන බැංකුව පරිගණක ජාලයක් මගින් සම්බන්ධ කර ඇති විට ලංකාවේ ගනුදෙනුකරුවෙකු මහජන බැංකු ශාඛාවකින් මුදල් ලබා ගැනීම.

28. හොඳ මුදලක ලක්‍ෂණයක් නොවන්නේ,
   1. පොදු පිළිගැනීමක් තිබීම. 2. පහසුවෙන් හඳුනාගත හැකි වීම.
   3. කල් පසු ගෙවීම් ක්‍රමයක් වීම 4. මුදලේ අගය උච්ඡාවචනය නොවිය යුතුය.

29. සංස්ථාපිත සමාගමක් ආරම්භයේදී සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් නොකල යුත්තේ,
   1. යෝජිත සමාගමේ නම.
   2. සමාගම පිහිටි ස්ථානය පෙන්නුම් කරන සිතියම
   3. ලේකම් ලෙස කටයුතු කිරීමට කැමත්ත දක්වන ප්‍රකාශය
   4. සාංගමික ව්‍යවස්ථාවලිය

30. නිෂ්පාදන පිරිවැය සමන්විත වන්නේ,
   1. ප්‍රාථමික පිරිවැය හා වක්‍ර ද්‍රව්‍ය, වක්‍ර ශ්‍රමය 2. පොදුකාර්ය පිරිවැය හා ඍජු ද්‍රව්‍ය ශ්‍රමය
   3. ද්‍රව්‍ය පිරිවැය, ශ්‍රම පිරිවැය හා වෙනත් පිරිවැය 4. ප්‍රාථමික පිරිවැය හා ඍජු වෙනත්, වක්‍ර වෙනත්

31. පොදුකාර්ය පිරිවැය සමන්විත වන්නේ,
    1. නිෂ්පාදන ගිණුමට අය කල හැකි සියලු ම වියදම් ය.
    2. සියළුම වක්‍ර පිරිවැය වලිනි.
    3. සියළුම විචල්‍ය පිරිවැය වලිනි.
    4. ප්‍රාථමික පිරිවැයෙනි.

32. ගිණුම්කරණ තොරතුරු වැදගත් කොට සලකන අභ්‍යන්තර පාර්ශවයක් නොවන්නේ,
    1. සේවකයන් 2. ගනුදෙනුකරුවන් 3. කළමණාකරුවන් 4. ආයෝජකයන්

33. ව්‍යාපාරයක ගිණුම් තොරතුරු පිළිබඳ උනන්දුවක් දක්වන පුද්ගලයින් ඇතුළත් කාණ්ඩය වන්නේ,
    1. ණයගැතියන්, නියෝජිතයන්, පාරිභෝගිකයන්, රජය.
    2. තැරැව්කරුවන්, වෘත්තීය සමිති, පාරිභෝගිකයන්, ණයහිමියන්
    3. නීතිඥයන්, බැංකුකරුවන්, අයිතිකරුවන්, සේවකයන්
    4. කළමණාකරුවන්, අයිතිකරුවන්, සේවකයන්, ණයහිමියන්

34. ගිණුම් තැබීමේ ප්‍රයෝජනය වඩාත් නිවැරදි ලෙස දැක්විය හැක්කේ කවරකින් ද?
    1. අයිතිකරුගේ හිමිකම දැන ගැනීම 2. නිවැරදි කළමණාකරණ තීරණ ගැනීම
    3. වත්කම් හා වගකීම් ප්‍රමාණය දැන ගැනීම 4. වෙනත් ව්‍යාපාර සංවිධාන සමග තරග කිරීම

35. ව්‍යාපාරික වත්කම් ලෙස දක්වා ඇති වගන්තිය තෝරන්න.
    1. ඉඩම් , ණයහිමියෝ, අතති මුදල් 2. බඩුතොගය, ණයගැතියෝ, අතති මුදල්
    3. බැංකු අයිරාව, ණයහිමියෝ, ගෙවිය යුතු පොලී 4. බැංකු අයිරාව, බැංකු ශේෂය, අතති මුදල්

36. පහත දක්වා ඇති ඒවායින් උපයෝගි පොතක් වනුයේ,
    1. ගැනුම් ගිණුම 2. විකුණුම් ගිණුම 3. ගැනුම් ජ'නලය 4. ආපසු යැවුම් ගිණුම

37. ඉදිරි කාල සීමාවක කරනු ලබන විකුණුම් වෙනුවෙන් ගනුදෙනුකරුවෙකුගෙන් අත්තිකාරම් මුදලක් ලැබීම සටහන් කල යුත්තේ,
    1. වත්කමක් ලෙස ය. 2. වගකීමක් ලෙස ය. 3. වියදමක් ලෙස ය. 4. ආදායමක් ලෙස ය.

38. එක්තරා වෙළෙන්දෙක් ගත්මිලට 10% ලාභ තබාගෙන භාණ්ඩයක් රු. 7,260 විකුණනු ලබයි නම් ඔහු එම භාණ්ඩය ගත් මිල කියද?
    1. රු. 6,600 2. රු. 660 3. රු. 6,534 4.. රු. 7,986

39. ව්‍යාපාරයක පවතින වත්කම් වල ලක්ෂණයක් වන්නේ,
    1. අනාගතයේ දී ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපරයකට ලබා දීම.
    2. අතීත ගනුදෙනුවක් තුළින් බිහි වු බැඳීමක් වීම.
    3. ව්‍යාපාරයේ පාලනයට යටත් නොවීම.
    4. එහි පිරිවැය විශ්වාසනාවයකින් මැනිය නොහැකි වීම.

40. ජංගම වත්කමක් නොවනුයේ,
    1. තොගය 2. ණයහිමියෝ 3. මුදල් ශේෂය 4. ණයගැතියෝ

**සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක**

සිසිර කුමාර **විසින් සම්පාදිත යි.**